DOI : 10.31357/fhssmst.2014.00645

# කාන්තාවන්ට එරෙහිව සිදුවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක්

## (ඉංගිරිය පොලිස් බල ප්‍රදේශය ඇසුරින්)


අපේක්ෂකයාගේ නම :- නිලන්ති වනිගසේකර

ලියාපදිංචි අංකය :- GS/ MAT/ CRI/ 3815/2009.

අධ්‍යයන වර්ෂය :- 2009/2010


ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

අපරාධ විද්‍යා විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය.

# අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහ මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බව සහතික කරමි.

Nw [signature] ---------------------------

අත්සන

2014.11.29

දිනය

## පරීක්ෂණ උපදේශකවරයාගේ නිර්දේශය

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවටත්, 2014.09.22 දින වාචික පරීක්ෂණයේදී පරීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දී ඇති සංශෝධන මාගේ සුපරීක්ෂණය යටතේ නිවැරදි කර ඇති බවත්, මෙම පර්යේෂණ වාර්තාව ශාස්ත්‍රපති උපාධිය ලබා දීම සඳහා සුදුසු බවත් සහතික කරමි.

2014/11/29 ..............................

දිනය

..............................

උපදේශකවරයාගේ අත්සන

*පිළිගැන්වීම*

දැඩි විනයක් පාලනයක් ඇතිව කුඩාකළ සිට අපව මෙහෙයවමින්

සමාජයට වැඩදායි පුරවැසියන් දස දෙනෙකු දායාද කළ

ආදරණීය අම්මාට හා තාත්තාට

සෙනෙහසින් පිළිගන්වමි!

## ස්තුතිය

- මෙම පාඨමාලාවේ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරමින් අනුපමේය මෙහෙවරක් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා හා මානවවිද්‍යා අධ්‍යනාංශයේ අංශ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය එම්. ඩබ්. ජයසුන්දර මහතාටත්,

- මෙම නිබන්ධය සකස්කර ගැනීමේදී අවශ්‍ය උපදෙස් ලබාදෙමින් ගැටළු නිරාකරණය කරදී මාර්ගෝපදේශකත්වය ලබාදුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහ මහතාටත්,

- තොරතුරු ලබාගැනීමේදී සහාය ලබා දුන් සියලුම ආයතන හා පුද්ගලයින්ටත්,

- මෙම නිබන්ධය සකස් කර ගැනීමේදී සහාය වූ දිලීපා පද්මාලි විදානපතිරණ මෙනවියටත්,

- ආදරණීය අම්මාටත්, දිරිය දුන් මානෙල් වනිගසේකර අක්කා ඇතුළු සහෝදරියන්ටත්, නන් අයුරින් සහාය වූ සියළුම දෙනාටත්,

කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමමි!

# පටුන


පළමු පරිච්ඡේදය

| | | |
|---|---|---|
| හැඳින්වීම හා ක්‍රමවේදය | | 1 - 09 |
| 1.1 | හැඳින්වීම | 1-03 |
| 1 2 | පර්යේෂණ ගැටළුව | 03-04 |
| 1.3 | අරමුණු | 04 |
| 1.4 | අධ්‍යයන ප්‍රදේශය | 04 |
| 1.5. | මූලාශ්‍ර | 05-07 |
| | 1.5.1. ප්‍රාථමික මූලාශ්‍ර | 05 |
| | 1.5.2. නියැදිය | 05 |
| | 1.5.3. ද්විතීක මූලාශ්‍ර | 06 |
| | 1.5.4. දත්ත රැස්කිරීමේ ක්‍රම | 06 |
| | 1.5.5 දත්ත විශ්ලේෂණය | 07 |
| 1.6 | අධ්‍යයනයේ ගැටළු හා සීමා | 07-08 |
| 1.7 | අධ්‍යයනයේ ව්‍යුහය | 08-09 |

දෙවන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මතවාද. | | 10-51 |
| 2.1 | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව පෙරදිග ඉගැන්වීම් හා මතවාද | 10-18 |
| 2.2 | ප්‍රචණ්ඩත්වය පිළිබඳ හැඳින්වීම | 19-33 |
| | 2.2.1 ප්‍රචණ්ඩත්වය පිළිබඳ මනෝ විද්‍යාත්මක මතවාද | 22-23 |
| | 2.2.2 ප්‍රචණ්ඩත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක මතවාද | 24-26 |
| | 2.2.3 ප්‍රචණ්ඩත්වය පිළිබඳ අපරාධ විද්‍යාත්මක මතවාද | 26-29 |
| | 2.2.4 ප්‍රචණ්ඩත්වය පිළිබඳ ජීව විද්‍යාත්මක මතවාද | 29-33 |
| 2.3 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 34-36 |
| 2.4 | කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 36-51 |

**තුන්වන පරිච්ඡේදය**

**කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ ජාතික හා ජාත්‍යන්තර ප්‍රවණතා මෙන්ම වර්තමාන නෛතික තත්ත්වය** **52-95**

3.1 ගෝලීයකරණය හා කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය. 52-54

3.2 තෝරාගත් රටවල්වල කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය 54-57

3.3 ශ්‍රී ලංකාවේ කාන්තාවගේ තත්ත්වය 57-65

3.4 රජය කෙරෙහි වගකීම යොමුවන ප්‍රචණ්ඩ ක්‍රියා 66-68

3.4.1 රජය කෙරෙහි වගකීම යොමුවන භාරකාරත්ව හිංසන ක්‍රියා. 66-67

3.4.2 සාංක්‍රමණික කාන්තාවන්ට එරෙහිව කරනු ලබන හිංසා 67-68

3.4.3 අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම 68

3.5 ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා අදාළ නීතිය 69-84

3.6 කාන්තාවන්ට එරෙහිව සිදුවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීමට ජාතික හා ජාත්‍යන්තර නීති ගෙන ඇති පියවර. 85-90

3.6.1 ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (සිඩෝ) 86-87

3.6.2 ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටු දැකීමේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය 88

3.6.3 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (කාන්තා සමානාත්මතාව හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය) 89

3.6.4 ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය 89-90

3.7 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට බලපාන හේතු සාධක විමර්ශනය 90-95

**හතරවන පරිච්ඡේදය**

**කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා.** **96-133**

4.1 අධ්‍යයන ප්‍රදේශය හැඳින්වීම 96-102

4.2 ක්ෂේත්‍රය ආශ්‍රිතව හඳුනා ගන්නා ලද කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය 102-116

4.3 කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම කෙරෙහි බලපාන හේතු සාධක 116-128

4.3.1 පුරුෂයා මත්පැන් පානය කිරීම 119-120

4.3.2 පවුලේ අඩු ආදායම හා ආර්ථික දුෂ්කරතා 120-123

4.3.3 අනියම් සම්බන්ධතා හා සැකය 123-124

4.3.4 පුරුෂාධිපත්‍යය 124-125

4.3.5 දායාද හා ඉඩකඩම් ණය ප්‍රශ්න 125-126

4.3.6 අධ්‍යාපන තත්ත්වය 126-128

4.3.7 දරුවන්ගේ ප්‍රශ්න 128

4.3.8 නැන්දම්මා ලේලි අතර ගැටුම් 128

4.4 අධ්‍යයන ක්ෂේත්‍රය ආශ්‍රිතව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නිසා කාන්තාව අත්විඳින ගැටළු 129-131

4.5 කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සඳහා පොලීසිය ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවායේ ඵලදායිතාවය. 131-133

**පස්වන පරිච්ඡේදය**

**නිගමන හා යෝජනා 134-141**

5. 1 නිගමන 134-137

5. 2 යෝජනා 137-141

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 142-147**

**උපග්‍රන්ථ 148-166**

සිද්ධි අධ්‍යයනය 148-166

සම්මුඛ පරීක්ෂණ උපලේඛනය 167-169

## රූප සටහන්, වගු, ප්‍රස්තාර නාමාවලිය

### රූප සටහන් අංක


| | | |
|---|---|---|
| 1.1 | කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසා | 02 |
| 2.1 | පුද්ගලයන් විසින් කරනු ලබන ප්‍රචණ්ඩ ක්‍රියා වර්ග | 32 |
| 3.4.1 | රජය වගකිවයුතු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා | 66 |
| 3.5.1 | මානව කුට්ටන මොඩලය | 76 |


### වගු අංක


| | | |
|---|---|---|
| 3.2.1 | ඉන්දියාවේ කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 57 |
| 3.3.1 | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා 1998 | 58 |
| 3.3.2. | 1995 - 1991 දක්වා ස්ත්‍රීන්ට එරෙහිව සිදුකළ ප්‍රචණ්ඩ ක්‍රියා | 59 |
| 3.3.3 | කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වයට අදාළ පැමිනිලි (1997 - 2001) | 60 |
| 3.3.4 | 1999 - 2001 අතර කාලය තුළ අවුරුදු 18 ට වැඩි කාන්තාවන්ට එරෙහිව සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවල සංඛ්‍යාත්මක දත්තයන් | 61 |
| 3.3.5. | ස්ත්‍රීන්ට එරෙහිව සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා (2003 - 2005) | 62 |
| 3.3.6 | ස්ත්‍රී දූෂණ සිදුවීම් (1982 - 2002) | 62 |
| 3.3.7 | ස්ත්‍රී දූෂණ (2003 - 2005) | 63 |
| 3.3.8 | 2007 වසරේ වසරේ වාර්තා වූ සමස්ථ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යාව | 63 |
| 3.3.9 | කාන්තා ග්‍රහන අපරාධ (2006 - 2009) | 64 |
| 3.3.10 | කාන්තා සුළු අපරාධ (2006 - 2009) | 65 |
| 3.4.2.1 | සංක්‍රමණික කාන්තාවන්ට එරෙහිව කරනු ලබන හිංසා පිළිබඳ සංඛ්‍යා දත්ත | 68 |
| 3.5.1 | ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී දූෂණ දත්ත | 71 |
| 3.5.2 | කාන්තාවන්ට එරෙහිව සිදුවූ මිනීමැරීම් (1996 - 2001) | 78 |
| 3.5.3 | වයස් මට්ටම අනුව 1996 වර්ෂයේ කාන්තාවන්ට එරෙහිව සිදු වූ මිනී මැරීම් සංඛ්‍යා දත්ත | 78 |
| 4:1:1 | ශ්‍රී ලංකාවේ පවුල් ආරවුල් ප්‍රමාණය (වසර 5 ක) | 97 |
| 4:1:2 | 2009 වර්ෂයේ පානදුර කොට්ඨාසයේ පොලිස් වසම් 08 තුළ වාර්තා වූ පවුල් ආරවුල් සංඛ්‍යාව | 98 |
| 4:1:3 | ජාතීන් අනුව මුළු ජනගහණය | 99 |
| 4:1:4 | පොලිස් ස්ථාන අනුව වාර්තා වූ පවුල් ආරවුල් | 100 |
| 4.2.1 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ පුද්ගලයින් | 102 |

4:2:2 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ ස්වභාවය 109
4:2:3 කාන්තාවන් විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට දක්වන ලද ප්‍රතිචාර 113
4.3.1 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම සඳහා බලපාන හේතු සාධක 117
4.3.2.1 අධ්‍යයනට ලක්වූ පවුල්වල ආදායම 121
4.3.6.1 කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම 126

ප්‍රස්තාර අංක

4:1:1 ජාතීන් අනුව මුළු ජනගහණය 99
4:1:2 පොලිස් ස්ථාන අනුව වාර්තා වූ පවුල් ආරවුල් 101
4.2.1 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ පුද්ගලයින් 103
4:2:2 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ ස්වභාවය 110
4:2:3 කාන්තාවන් විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට දක්වන ලද ප්‍රතිචාර 114
4:3:1 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම සඳහා බලපාන හේතු සාධක 118
4:3:2.1 අධ්‍යයනට ලක්වූ පවුල්වල ආදායම 122
4:3:6.1 කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම 127

# කාන්තාවන්ට එරෙහිව සිදුවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක්

## (ඉංගිරිය පොලිස් බල ප්‍රදේශය ඇසුරින්)

## අපේක්ෂකයාගේ නම:- නිලන්ති වනිගසේකර

## නිබන්ධ සාරාංශය


ලෝකයේ බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද බහුල වශයෙන් අත්විඳීමට සිදුවන සමාජ ගැටළුවක් ලෙස කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හඳුන්වා දීමට පුළුවන. සමාජය විසින් සැළකිල්ලක් නොදැක්වුවද බරපතල සමාජ ගැටළු රාශියක් මේ තුළින් පැන නගින බව පැහැදිලි විය. දිගින් දිගටම නිවස තුළ සිදුවන ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵලයක් ලෙස පවුලක් තුළ තිබිය යුතු සමගිය, සමාදානය, ඉවසීම තුරන් වී දික්කසාද වීමේ ප්‍රතිශතය ඉහළ ගොස් තිබේ. මෙම ගැටළුව නිසා පවුලක් තුළ දරුවන්ට තිබෙන ආරක්ෂාව, රැකවරණය අහිමි වී පෞරුෂත්ව වර්ධනයේ අඩුපාඩු සහිත දරු පරපුරක් බිහිවීම නෙවැළැක්විය හැකි ය. පවුලක් තුළ ස්වාමියා හා භාර්යාව අතර දිගින් දිගටම සිදුවන්නා වූ අර්බුදයන් පවුල් ආරවුල් ලෙස පොලිසියට වාර්තා වේ. දෙපාර්ශවය ගෙන්වා සාමයෙන් සිටින ලෙස අවවාද කිරීම පමණක් මෙවැනි ගැටළුවකට ප්‍රමාණවත් වේදැයි බුද්ධිමත්ව සිතිය යුතු කාලය එළඹ ඇත. මෙම ගැටළුවේ තිබෙන්නා වූ බරපතල බව නිසාම කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක් ලෙස ඉංගිරිය පොලිස් බල ප්‍රදේශය තුළ පොලිසියට වාර්තා වූ පවුල් ආරවුල් නියදියක් ගෙන මෙම පර්යේෂණ නිබන්ධය සිදු කළෙමි.

මෙමඟින් ඉටුකර ගැනීමට යෝජිත පරමාර්ථ ලෙස කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවල මූලික ලක්ෂණ, ගොදුරුවන්නන්ගේ ලක්ෂණ හා භූමිකාව හඳුනා ගැනීම, පාත්‍රවන්නන්ගේ ලක්ෂණ හා භූමිකාව හඳුනා ගැනීම, එයට බලපාන හේතු සාධක හා ඵල විපාක ගැන සොයා බැලීමක් සිදුකර ඇත. පර්යේෂණය මඟින් බැසගත් නිගමන තුළින් මෙම ගැටළු අවම කර ගැනීමට අවශ්‍ය යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීම තුළින් සමාජ මෙහෙවරක් ද ඉටුකර ඇත.

මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී 2010 වර්ෂය තුළ ඉංගිරිය පොලීසියට වාර්තා වූ පවුල් ආරවුල්වලින් ජන සංයුතියට අනුව අහඹු ලෙස තෝරාගත් පවුල් ආරවුල් 200ක් පර්යේෂණයට භාජනය කරමින් මෙම නිබන්ධය සිදුකරන ලදි. එහිදී සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී සහ

නිරීක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කරන ලදි. එසේම දිගින් දිගටම සිදු වූ පවුල් ආරවුල් හේතුවෙන් බිඳී වෙන් වී ගිය පවුල් ආරවුල් 10ක් තෝරා ගනිමින් සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය යටතේ ද විග්‍රහයක් සිදුකරන ලදි.

එසේම මෙම පර්යේෂණයේ දී ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම කෙරෙහි බලපාන හේතු සාධක ලෙස කරුණු රැසක් අනාවරණය කරගැනීමට හැකි විය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ පුද්ගලයන්, එල්ල කළ ස්වභාවය, කාන්තාවන් විසින් දක්වන ලද ප්‍රතිචාරය, එම නිසා කාන්තාව අත්විඳින ගැටළු හා කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සඳහා පොලීසිය ගෙන ඇති ක්‍රියා මාර්ග හා ඒවායේ ඵලදායිතාව පිළිබඳ මෙහිදී සොයා බලන ලදි.

මෙම පර්යේෂණයට අනුව බැසගන්නා ලද නිගමනයන් හා ඒවායින් වැළකීම සඳහා ගත හැකි යෝජනා කිහිපයක් මෙම නිබන්ධය මඟින් ඉදිරිපත් කරන ලද අතර කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නැති කිරීම සඳහා සමාජයේ නිසි අවධානය යොමුවීමේ වැදගත්කම පිළිබඳ පණිවිඩයක් දීම මෙම පර්යේෂණ නිබන්ධයෙන් බලාපොරොත්තු වේ.

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම හා ක්‍රමවේදය

## 1. 1 හැඳින්වීම

කාන්තාවන්ට එරෙහිව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අනාදිමත් කලක සිට ලෝකය පුරා ව්‍යාප්තව පවත්නා උවදුරකි. එහෙත් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු වන්නේ මෑත කාලයේදීයි. සමාජ විද්‍යාව, අපරාධ විද්‍යාව සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීමේදී පවුල තුළ කාන්තාවට සිදුවන හිංසනය සමාජ ගැටළුවක් වශයෙන් අර්ථ දැක්වීම සිදු විය. ඒ අනුව පවුලක් තුළ කාන්තාවන්ට සිදුවන ගැටළුකාරී වාතාවරණය සමාජ ප්‍රශ්න විශාල ප්‍රමාණයක් ඇති කිරීමට හේතු සාධක වී තිබේ. මෙම කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ පමණක් නොව ඇමරිකාව, බ්‍රිතාන්‍ය වැනි සංවර්ධිත රටවල් පවා මුහුණ දෙන අර්බුදයක් වී ඇත.

කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මේ වන විට බොහෝ අණපනත් මෙන්ම, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විශේෂ අවධානයක් යොමු කිරීමත්, ප්‍රචණ්ඩත්වය සමාජ ගැටළුවක් ලෙස අර්ථකථනය කිරීමට පෙළඹීමත් සිදු වුවද, තවදුරටත් අප සමාජයේ කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වන නිසා ඒ සඳහා බලපාන හේතු සාධක වඩාත් ගැඹුරින් විමසා බැලීම මෙම අධ්‍යයනය සිදු කිරීමේ මූලික අරමුණ වේ.

කාන්තා කාර්යාංශය මගින් ප්‍රකාශිත කාන්තාවන්ට එරෙහි හිංසා පිළිබඳ අත්පොතෙහි මාරසිංහ විසින් පෙන්වා දෙන්නේ, පවුල තුළ දිගින් දිගටම පැවත එන සුළු සුළු ගැටළු විශාල සමාජ අපරාධයක් වී එළියට එන අවස්ථා බොහෝ ඇති බවයි (මාරසිංහ, 2000).


මානව අයිතීන් සුරක්ෂිත කිරීමේ එකඟතාවන් ලෝකයේ බොහෝ රටවල ඇති කරගෙන තිබුන ද ප්‍රායෝගික සමාජයේදී එම අයිතීන් ඉතා කණගාටුදයක අන්දමින් උල්ලංඝණය වන බව කිව යුතුයි.

පොලීසියට ලැබෙන පවුල් ආරවුල් විමර්ශනය කර බැලීමේදී මෙන්ම අපරාධ සම්බන්ධයෙන් පසු විපරමක් කිරීමේදී ද පවුල තුළ ප්‍රචණ්ඩත්වයේ අහිසි ප්‍රතිඵල ලෙස ඒවා වර්ග කළ හැකියි. හිංසනයේ අහිසි ප්‍රතිඵලයක් ලෙස පොලීසියට වාර්තා වන කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධව සලකා බලන විට සාපරාධී බලහත්කාරය, අයුතු අවහිරය හා අයුතු හිරකර තැබීම, ව්‍යාභිචාරය, මනුෂ්‍ය ඝාතනය, බරපතල තුවාල කිරීම, වෛවාහික ස්ත්‍රී දූෂණය, අඩන්තේට්ටම් කිරීම, මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම, දරුවන්ගේ රැකවරණය අහිමි

කිරීම ආදිය දැක්විය හැකි ය. ඒවා තේරුම් ගැනීමේ පහසුව තකා පහත සටහනින් උපුටා දක්වමි.

රූප සටහන් අංක 1.1

කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසා




(මාරසිංහ,1997,16)

මෙම අධ්‍යයනය කාලීන හා ප්‍රායෝගික වශයෙන් වැදගත් වන්නේ රටක් සංවර්ධනය කරා යාමේ දී මෙවැනි උග්‍ර සමාජ ගැටළු අවම වීම අත්‍යාවශ්‍ය කරුණක් වන බැවිනි. පවුල තුළ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන කාන්තාවන් තුළින් සමාජයට අවශ්‍ය කරන ප්‍රතිඵලයන් ලබා ගැනීම අපහසු වේ. පීඩාකාරී මානසික තත්ත්වයෙන් යුතු දරුවකු සමාජයට වෛර කිරීමට පෙළඹේ. මෙම වෛරය කුමන ආකාරයකින් හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සේ මතු වීමට බොහෝ ඉඩකඩ පවතී.

ගම්බද පවුල් සංස්ථාව තුළ ඇති ප්‍රචණ්ඩත්වය එළියට නොඑන්නේ එම කාන්තාව විසින් එය තමාගේ දෛවය ලෙස සැලකීම හා දරුවන් වෙනුවෙන් ඉවසීම යයි සුගලා 'සංසුන් අඩවියක තහනම් නියෝග' නමින් ඇයගේ ඉදිරිපත් කිරීමේදී පෙන්වා දී ඇත. පවුල තුළ තිබෙන

ප්‍රචණ්ඩත්වය ඇතැම් අවස්ථාවල පවුල් ආරවුල් ලෙස පොලීසියට පැමිණිල්ලකින් ලැබෙන අතර ගම්බද ජීවත් වන කාන්තාව ලැජ්ජාව, භය සහ නොදැනුවත්කම නිසා පීඩාවෙන් දුක්ඛිත ජීවිත ගත කරයි. ගම්බද ප්‍රදේශවලදී මෙම හිංසනයන් ශාරීරික සහ ලිංගික ලෙස සිදුවීමේ ප්‍රවණතාවයක් පවතී. නගර බද ප්‍රදේශවල මෙම හිංසනයන් සිදු වන්නේ මානසිකව හෝ භාවික, වාචික වශයෙනි. මෙහිදී ඛේදනීය තත්ත්වය වන්නේ ගම්බද ප්‍රදේශවල මෙම හිංසනයන් තම දෛවය ලෙස සැලකීමට පෙළඹීමත් හා නාගරිකව මෙම තත්ත්වය වෙනස් වී විශේෂයෙන් කොළඹ අධිකරණයන් තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහිව නීතිය මගින් කටයුතු කිරීමට පෙළඹෙන ප්‍රවණතාවය වැඩි වී තිබීමත් ය (සුගලා කේ, සිසාරා වෙළුම 1). මෙම කරුණු දැක්වීමට අනුව අතීත කාන්තාව මෙන් නොව වර්තමාන කාන්තාව ප්‍රචණ්ඩත්වයට එරෙහිව නැගී සිටීමේ ප්‍රවණතාවයේ වර්ධනයක් පෙන්නුම් කරයි.

මෙසේ සමාජය විසින් නොසලකා හරින සමාජ ගැටළුවක් වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සිදුවන්නා වූ අර්බුද සම්බන්ධයෙන් සොයා බැලීමට රජය මෙන්ම විවිධ ආයතන හා සංවිධාන කටයුතු කරමින් සිටී. පවුල තුළ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් භයානක සෞඛ්‍ය තර්ජනයකට ගොදුරුවන කාන්තාවන් ද සිටී. ඒවා ශාරීරික පීඩා, මානසික පීඩා, පෞරුෂයෙහි ඇතිවන අසාමාන්‍යතා ලෙස ද දැක්විය හැකි ය. පෞරුෂයෙහි ඇතිවන අසාමාන්‍යතා නිසා ඇතිවන භයානකම ප්‍රතිඵලයක් වන්නේ සියදිවි නසා ගැනීම ය. ශ්‍රී ලංකාව තුළ මෙය බහුලව සිදුවන අතර පසුගිය දශකය තුළ යුද්ධය නිසා අහිමි වූ ජීවිත ගණනකට වැඩි ජීවිත ගණනක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නිසා අහිමි වී ඇත. මේ අනුව සමාජය පුරා වසා පැතිර පවතින කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වර්ධනය වීම සම්බන්ධයෙන් හේතු සාධක සොයා බැලීම කාලීන අවශ්‍යතාවයකි.

## 1.2 පර්යේෂණ ගැටළුව

කාන්තාවන්ට එරෙහිව සිදුවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳව නිරන්තරයෙන්ම කරුණු වාර්තා වන නමුත් එකී සාපරාධී සංසිද්ධියෙහි යථා ස්වභාවය ශාස්ත්‍රීය වශයෙන් අනාවරණය වී නොමැති බව පෙනීයයි. මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන වශයෙන්ම පර්යේෂණ ගැටළුව වශයෙන් හඳුනා ගැනීමට අදහස් කරනු ලබන්නේ කාන්තාවන්ට එරෙහිව සිදුවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙහි මූලික ලක්ෂණයන් හා එම ලක්ෂණ අතර කවර සහසම්බන්ධතාවයක් පවතින්නේද යන්න පිළිබඳව ය. ඒ අනුව කාන්තාවන්ට එරෙහිව සිදුවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවල ස්වභාවය, බරපතලකම, එකී ක්‍රියාවන් සිදුකරන්නන්ගේ ගති ලක්ෂණ, ඒවාට පාත්‍ර වන